පටන් ගන්න තැන

පසුගිය සති අන්තයක උපන්දින සාදයකදි සෙට් වෙලා ඉන්න අතරේ සුපුරුදු විදිහට අව්ව වැස්ස ක්‍රිකට් දේශපාලනය ඔස්සේ පැමිණි කතාව අප ජීවත්වන ප්‍රදේශයේ සිදුවෙමින් පවතින සංස්කෘතික හා පාරිසරික වෙනස්වීම් ගැන කතාවකට පැමිණුනා. මගේ

මිත්‍රයන්ගේ කතා වල පොදු අදහස වුණේ මෙහෙ දෙයක්.

මාර වැඩේ. දැන් මේ පැත්තෙ කොලිට් එක මාර විදිහට බැහැලා.. ඔසියෝ කවුරුත් නැහැ.. කල්ලොයි අරාබියොයි ලෙබ්බොයි ඇෆ්ඝන්ලයි ෂිපියොයි විතරයි.. හැම දේම චීප් ලෙවල් එකට බැහැලා.. බලන්න.. ප්ලාසා මොපින් සෙන්ටර් එක වේලෙනවා.. මුං හැම තැනම ගැන්සි ගැහිලා..

ඔය වගේ තවත් කතා ගොඩක් ගියා මේ විපර්යාසය ගැන. වෝදනා ගොඩයි.

කතාව ඇත්ත . මං ඉන්න නොබල් පාක් වලත් දැන් කලු කට්ටිය වැඩියි තමයි. ටික කාලෙකට ඉස්සෙල්ලා වලි ත් තිබුණා. ඒත් දැන් කළු ජාතිකයන්ගෙ කල්ලි ගැහිල්ල නැති වෙලා. ඔවුන් ප්‍රධාන ප්‍රවාහයට එක්වෙලා. සාමාන්‍ය තත්වයට වැටිලා වගේ දැනෙනවා. දැන් කරළියට ඇවිත් ඉන්නෙ අරාබි හා ඇෆ්ඝන් ප්‍රජාවයි.

මේ ගැන කතාබහේදි මගේ අදහස උනේ මේකත් අර වගේම සාමාන්‍යකරණය වෙයි කියන එකයි. තියෙන්නෙ කාලය පිළිබඳ ප්‍රශ්නය විතරයි. ඒකට මගෙ මිත්‍රයන් එකඟ වුණේ මුන්ට පෙහෙම අයිතියක් නැහැ වගේ හැඟීමක් එක්ක. මං 90 දශකයේ මෙහෙට ආව කෙනෙක්ගෙන් මේ ගැන අදහස් විමසුවා. ඔහු කිව්වේ මෙහෙම කතාවක්.

මල්ලි මේ මෑතකදි මෙහෙට එන අපේ මිනිස්සු එන්නේ මොකක් හරි සම්බන්ධතාවක් එක්ක. ඒ එනකොට මිනිස්සුන්ගෙ අවශ්‍යතාවන්ගෙන් බාගයක් මෙහෙ ඉන්න කෙනා සපුරනවා.. එතකොට ඔයාට හැබෑ ඇරඹුමක ඇති දුෂ්කරතාව තේරුම් යන්නෙ නැහැ.. ආපු ගමන් තමන්ගෙ අරමුණු වලට ලෙඩියෙන් යන්න පුළුවන් වටපිටාවක් තියෙන නිසා සැබෑ තත්වය තේරුම් ගන්නෙ නැහැ.. අනික මල්ලි අපි ආපු මුල් කාලේත් අපට රස්සා තිබුණෙ නැහැ.. අපට තිබුණ ලොකුම කෑම තමයි චිකන් ඇන්ඩ් චිප්ස්.. ඩොලර් දෙක තුනයි යන්නෙ.. අපිත් හැමදාම හවසට කොහේ හරි සෙට් වෙනව. හවසට හෙමින්ස් පාක් එකේ ක්‍රිකට් ගහනව.. කට්ටිය එකට ඉන්නකොට තමයි ශක්තියක් ඇතිවෙන්නෙ.. අපි එහෙම ඉන්නකොට ඒ කාලේ ඔසියෝ ශ්‍රීක් ඉතාලි කාරයෝ අපිට කියන්න ඇත්තෙත් ඔය කතාවම තමයි.. අපිත් ටික ටික තමයි මේ තත්වෙට ආවෙ.. අපි එදා කරපු දේවල් තමයි අද මුං කරන්නෙ.. ඒක අරුමයක් නැහැ.. ඒත් අපිට හැම තිස්සෙම මුල මතක තියෙන්න ඕනෙ.. මුල් හයිය නැති ගස් ඉක්මණට වැටෙනවා මල්ලි.. සේරටම වඩා වැදගත් වෙන්නේ අපි හැමෝටම මෙහේ ඇවිත් ජීවිතේ ගොඩනගාගන්න ඉඩදෙන්න තරම් මේ රට ගොඩ නගපු මිනිස්සු කරුණාවන්ත වීම ගැන සාධාරණව හිතන්න පුරුදු වීමයි..

ඒක නම් මාර කතාවක් තමයි.

මුල අමතකවීම

ඉස්සෙල්ල ලිව්ව කතාව ලියද්දිම මේකත් ලියන්න හිතුවා.

පහුගියදාක පාටි එකකට ගිය වෙලාවෙම තමයි මේකත් අහන්න ලැබුණෙ. පාටියේ හිටිය ටිකක් මැදිවයසෙ හාදයෙක් ඩෝල් එකෙන් ඉන්න මිනිස්සුන්ට පලු පැළෙන්න බණිනවා..

"බලනවා අයියෙ.. අපි පණ දාගෙන රස්සාවල් කරලා ටැක්ස් ගෙවනවා.. මුන් නිකම් ඉඳන් අපි ගෙවන ටැක්ස් සල්ලි වලින් සැප විඳිනවා.."

මගේ ළඟවාඩි වෙලා හිටිය මගේ යාළුවා මා දිහා බලල ඉඟි මැරුවා. කාටත් නෑහෙන්න මට මෙහෙම කිව්වා "මචං ඔය කෑ ගහන හාදයා අවුරුදු

පහක් ඩෝල් එකේ හිටියා රස්සාවක් හොයා ගන්න කලින්.. මිනිහට දැන් මුළ අමතක වෙලා"

සිසිර සරණිය

උපහාර කරන්න වටින මිනිහෙකුගෙ උපහාර උළෙලකට පසුගිය සතියෙ ගියා. ඒ සිසිර සරණිය. සිසිර දිසානායක අයියා ගැන අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැනෙ. එයා සකල කලා වල්ලභ කෙනෙක්. කවිද ගීතද ලිපිද විචාරද සාහිත්‍යයද විද්‍යාවද මොනවද නැත්තේ? මේ වැඩේ සංවිධානය කරපු හෙළ මාතා එකටත් අපි බොක්කෙන්ම ආචාර කරනවා. එදා රෑ හාමත් වෙලා හිටිය අපේ බොක්ක නොමිලේම පුරවපු නිසාම නෙවෙයි. හොඳ අරමුණක් වෙනුවෙන් හොඳ උත්සවයක් නොමසුරුව සංවිධානය කරල තිබුණ නිසා.

හොඳ ප්‍රබුද්ධ දේවලට මිනිස්සු එන්නෙ නැහැ. ජොලියක් ෆන් එකක් තිබුණොත්



තමයි එන්නෙ කියලා හිතලා ඒ විදිහේ දේවලට මුල් තැන දීලා සංවිධානය කරන ඕගනයිසර්ස්ලට මෙන්න හොඳ පිළිතුරක්. හොඳ වැඩකට හොඳ මිනිස්සුන්ට පුදන්න සළකන්න අව්ව වැස්ස දුරකතර වේලාව අවේලාව මිනිස්සු තකන්නේ නැහැ. තවමත් මේ ලෝකේ හොඳ මිනිස්සු යුතුකම් දන්න මිනිස්සු ඉන්නවා. එදා ඒක ඔප්පු වුණා.

ඔය වගේ උත්සව වලදි තමයි මිනිස්සුන්ගේ අතීත ජීවිතේ රස මුසු තැන් අනුවණ කම් ලෙන්ගතුකම් ගැන කතන්දර දැනගන්න පුලුවන් වෙන්නෙ. මං හිතන්නෙ මිනිස්සු ඒ රසය හොඳට වින්දා.

හැමෝටම මල් මිටක්.

ඡන්දෙන් පස්සෙ

පහුගිය මැතිවරණය ගැන මම කතා කරන්න කැමැති නැහැ. මුකුත් නිසා නෙවෙයි. අපේ පොඩි අයියලා නිසා..

මට එයාල ගැන මාර දුකයි. එයා නම් කියන්නෙ "මල්ලි මේක මාර පරාජය" කියලයි.

රටම හිතපු ප්‍රතිඵලය අනික් පැත්ත පෙරලුණා. ප්‍රශ්න ගොඩයි. විවේචන රැසයි. අර්බුද නිමක් නැහැ වගේ. හිතුන ප්‍රතිඵලය ආවා නම් සේරම ගොඩ. ජයග්‍රහණයට පියවරු දාහයි පරාජය අවජාතකයි කියලා කියන්නෙ ඒකනෙ. මං නම් හැමදාම හිතන්නෙ රටේ ජනතාවගේ හැටියට තමයි රටට පාලකයන් ලැබෙන්නෙ කියලයි. ඉතින් දැන් ඒහෙම වෙලා තියෙනවා.

සෝභිත හාමුදුරුවෝ කියනවා වගේ එක අතකට ඒක හොඳයි. රජයටත් මුදල් කෝටි ගණනක් ඉතිරි කරගන්න පුලුවන්. ආපසු මැතිවරණ අවශ්‍ය නැහැ. දෙගොල්ලෝ එකතු වෙලා රට පාලනය කළාම ඉවරයි. මරු මෙතඩි එක. ඒ කේස් එකට මේ කේස් එක අයින් කළා. මේ කේස් එකට ඒ කේස් එක අයින් කළා. වලි නැහැ. සම්මුති විතරයි. අපි බලන් ඉමු. අලුත් අත්හදා බැලීමක්නෙ.

ස්තූතියි

පත්තරවලට ලියන අයට තියෙන එකම සතුට තමයි තමන් ලියන දේ අනෙක් අයගෙ අවධානයට ලක්වෙනවා කියලා දැනගන්න එක. විශේෂයෙන් මිනිස්සුන්ගෙන් බැණුම් ඇසීමේ අවදානමත් අරගෙන ලියන මේ වගේ ලියවිල්ලක් පාඨක අවධානයට ලක් වීම සතුටක්. පසුගිය සතියෙ ආනන්ද ගුණතිලක කියන මහත්මයා දක්වා තිබුණ ප්‍රතිචාරයට වුටි මල්ලිගේ ස්තූතිය පිරිනමන්න කැමතියි. ප්‍රතිචාරය සාධනීය වුණත් නිශේධනීය වුණත් ප්‍රශ්නයක් නැහැ. වැදගත් වෙන්නෙ කාලය මිඩංගු කරලා තමන්ගෙ අදහස දන්වා එවීමයි. ඔබ වැනි පාඨකයන් අප වැනි පුංචි ලේඛකයන්ට ශක්තියක්.

ආනන්ද ගුණතිලක මහත්මයා දක්වා තිබුණ

අදහස් ගැන යමක් ලියන්නම්. ස්වයං වාරණය කියන්නෙ පළායාමක් නෙවෙයි. පියවරක් පසුපසට ගැනීමක්. පියවරක් පසුපසට ගන්නෙ පියවර දහයක් ඉදිරියට යාමේ බලාපොරොත්තුවෙන්. වුටි මල්ලි කවදාවත් සටන් වලින් පැනලා ගිය මිනිහෙක් නම් නෙවෙයි. ඕනෙම සටනකදි අධෛර්ය නොවී අවසානය දක්වාම ඉන්න මනුස්සයෙක්. ඒ නිසා අපි ගැන විශ්වාසයෙන් ඉන්න. අපි සටන අතඅරින්නෙ නම් නැහැ. සහතිකයි.

මනරංජන වැඩ වර්ජන

ඕස්ට්‍රේලියාවට ආවට පස්සෙ වැඩවර්ජන කිපයක්ම දැක්කා. අපේ වැඩපොළේදිත් දවසක වර්ජනයට සහභාගි වුණා. අරගල හා යුනියන් ගැන මෙහේ ජනතාවගේ ආකල්ප නම් එහේ වගේම තමයි. කිසිම වෙනසක් නැහැ. හැමෝම බලන්නෙ යුනියන් එකේ පැවැත්මට වඩා තමන්ගෙ වැඩේ ගැන විතරයි. වෙනස ඇත්තේ මෙහි දී අපට සම්තිය වෙනුවෙන් ගෙවීම අනිවාර්ය වීම විතරයි. ගොඩ දෙනෙක් ඒ ගැන හිතන්නෙ සම්තියෙන් අපිට වැඩක් වීම අනතුරකින් පස්සෙ රක්ෂණ දීමනාවක් ලැබෙනවා වගේ වැඩක් කියලා. වෘත්තිය සමිති විසින් ඉතිහාසය පුරා මිනිස්සුන්ට ලබාදීල තියෙන ජයග්‍රහණ ගැන කතා කිරීම නිෂ්ඵල දෙයක්. ඒව ගැන හිතන්නෙ තකන්නෙ ටික දෙනයි. ඒ වුණාත් වර්ජන නිසා සාමාන්‍ය ජනතාවට වන බලපෑම අවම කරන්නත් කිසියම් වූ හානියක් වුවහොත් වර්ජකයන්ට එරෙහිව නීතිමය කටයුතු කරන්නත් අවස්ථාවක් මෙහි තිබීම නම් විශේෂයි. ඒක හාමිපුතුන්ට වාසි වගේ බැලූ බැල්මට පෙනුණත් අපේ රටවල වර්ජන නිසා ජනතාව විඳින දුක මතක් වෙනකොට හොඳයි කියලත් හිතෙනවා. මතකනෙ දොස්තරල ස්ට්‍රයික් කරනකොට ලෙඩ්ඩු කන පරිප්පුව. මගේ මිත්‍රයො නම් කියන්නෙ අපේ රටේ කෙරෙනස ස්ට්‍රයික් එක්ක බලනකොට මේව මොනවද කියලයි. නිකම් විහිලුනෙ මචං.. පිකට් කරල කෑගහල වැඩ වරලා පරිපාලනය වට කරලා හෙට්ටු කරලා ඉල්ලිම් දිනාගත්ත අපිට දින දීල ටයිම් දීල සෙට් වෙන්න කාලය දීල කරන මේ ස්ට්‍රයික් නිකම් පිස්සු වගේ අප්පා..

බස් හරි කෝච්චි හරි ස්ට්‍රයික් කරන්න ඕනෙ උදේටයි නවසටයි. මිනිස්සු යන්නැති වෙලාවට ස්ට්‍රයික් කරලා පරිපාලනයට බලපෑම් කරන්නෙ කොහොමද? අපි වෙලාව කළින් දුන්නම මිනිස්සු විකල්ප කළින්ම හොයා ගන්නවෙනෙ. එතකොට "ස්ට්‍රයික් එක නිකම් පුස් වෙඩිල්ල වගේ වෙනවනෙ. නිතරම ලේ රත් වෙලා තිබුණ අපේ ඇඟවල් වලට මේක නිකම් හුරු නෑ නෑ වගේ. සාකච්ඡාව විසංවාදය සම්මුතිය.. ඒව තියෙන්නෙ ශබ්ද කෝෂ වල.

අපේ වැඩපලේ සගයෙක් කිව්වා 90 මුල් කාලෙ කෝච්චි ස්ට්‍රයික් ඒකේදි කම්කරුවො කෝච්චි පාර වෙල්ඩින් කළා ලු. අන් වැඩ. ඒ වගේ තියෙන්න එපායැ. වැඩපලේ කට්ටිය නම් කියන්නෙ මේව මේ යුනියන් කාරයොයයි කොම්පැණියයි කතා වෙලා ගහන ගේමක් කියලා. ඕව කරන්නෙ යුනියන් කාරයන්ගෙ පැවැත්මට මිසක් අපට ලැබෙන දෙයක් නැහැ වගේ. ප්‍රතිගාමියොනෙ....

වුටි මල්ලි